චක්‍රලේඛ - 99/01.

මගේ අංකය: දපපා/05/55.

සියළුම පළාත් පාලන ආයතන ප්‍රධානීන් වෙත.

**පළාත් පාලන ආයතනවලට අවශ්‍ය, එම ආයතන විසින් දැනට පරිහරණය කරන රජයේ ඉඩම් පවරා ගැනීම.**

පළාත් පාලන ආයතනවලට අයිතිව හෝ බුක්තිවිඳිනු ලබන දේපල බොහොමයක්ම රජයට අයත් දේපල හෝ ඉඩම් වේ. රජයසතු ඉඩම් හෝ දේපල පොදු කටයුතු සඳහා පළාත් පාලන ආයතනවලට පවරාදීම, නිත්‍යානුකූලව සිදුවී ඇත්නම්, එම පැවරීම තහවුරුකිරීම සඳහා ලිඛිත සාක්ෂි වශයෙන් පැවරුම් නියෝග/භාර/ප්‍රධානයන් /ඔප්පු ආයතනයේ සුරක්ෂිතව තිබිය යුතු අතර, වත්කම් ලේඛණයේ එම දේපලසතු සියලුම විස්තර සඳහන් කළයුතු වේ.

02. බොහෝ පළාත් පාලන ආයතන රජයේ ඉඩම් තම කටයුතු සඳහා භාවිතාකරන නමුත්, ඒවා රජයෙන් නිත්‍යානුකූලව පවරාගැනීම සිදු නොකිරීම හෝ නිත්‍යානුකූලව පවරාගැනීම් ඇති අවස්ථාවලදී ඊට අදාල ලේඛණ සුරක්ෂිතව තබා නොගැනීම සිදුකර ඇති බව පෙනීගොස් ඇත. මේ තත්ත්වයන් නිසා පළාත් පාලන ආයතන පරිහරනය කරනු ලබන දේපලවල සියළුම හිමිකම් අයිතිරණය ඉදිරියේ අභියෝගයන්ට ලක්ව, අවාසි සහගත තීරණයන්ද ලැබී ඇත.

03. පළාත් පාලන ආයතන සංස්ථාපනය කරනලද පනත්වල එම ආයතන සතු කරනලද සියළුම දේපල පරිහරණය කිරීම එහි ආදායම් ලබාගැනීම, නඩත්තුකිරීම හා ආරක්ෂාකරගැනීම වගකීමක් බවට පත්කර ඇත. මේ සම්බන්ධව විධිමත් වැඩපිළිවෙලක් සකස් කරන ලෙස පළාත් පාලන ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ඉල්ලීමක් කර ඇත. රජයේ දේපල හෝ ඉඩම් සම්බන්ධව පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කරන ලෙස මෙයින් උපදෙස් දෙමි.

1. බලප්‍රදේශයතුල දැනටමත් පළාත් පාලන ආයතන බුක්තිවිඳිනු ලබන රජයේ ඉඩම් පිළිබඳව හතර මායිම් සමඟ භූමි ප්‍රමාණය හා අනෙකුත් විස්තර රැස්කර තබන්න.
2. එම ඉඩම් සම්බන්ධව පැවරුම් නියෝග/ප්‍රධානයන්/භාර/වැනි නෛතික ලේඛණ ඇත්නම්, එම දේපල වත්කම් ලේඛණයේ සටහන්කොට අදාල ලියකියවිලි සුරක්ෂිතව සේප්පුවක බහා තැබිය යුතුය.
3. එවැනි ලේඛණ නොමැති අවස්ථාවලදී, සභාව බුක්තිවිඳිනු ලබන සහ පරිපාලන කටයුතු වලට යටත්වන සුසානභූමි, ක්‍රීඩා පිට්ටනි, පොදු කටයුතු සඳහා වෙන්වූ භූමි භාග ආදී රජයසතු දේපල සම්බන්ධ තොරතුරු සොයාබලා, එම ඉඩම් සභාවට පවරා දෙන ලෙසට සභා තීරණයක් ගෙන පැවරුම් නියෝග ලබාගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් මඟින් පළාත් ඉඩම් කොමසාරිස් වෙත ඉල්ලීමක් කරන්න. මීට අදාල අයදුම් පත්‍ර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් හෝ පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලයෙන් ලබාගැනීමට කටයුතු කරන්න.
4. පළාත් පාලන ආයතනයකට පරිත්‍යාග වශයෙන් හෝ මිලදී ගැනීමෙන් හෝ අත්පත්කරගැනීම මඟින් පැවරී ඇති සියලු දේපල පිළිබඳව නිවැරදි තොරතුරු වත්කම් ලේඛණයේ සටහන් කිරීමට ක්‍රියා කරන්න.
5. එම දේපල සම්බන්ධයෙන් ආයතනයට ලැබියයුතු සියළුම ආදායම් ලබාගැනීමට වාර්ෂිකව ක්‍රියා කිරීමද සභාවේ වගකීමක් වේ.

/2 පිටුවට..

04. පළාත් පාලන ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව රජයේ ඉඩම් කොමසාරිස් සමඟ මේ සම්බන්ධයෙන් පැවැති සාකච්ඡාවපරිදි පළාත් පාලනයට මෙතෙක් නීත්‍යානුකූල පැවරී නොමැති එහෙත්, දැනටමත් පළාත් පාලන ආයතන භුක්තිවිඳින රජයේ ඉඩම් එම ආයතනවලට පවරා දෙන ලෙසට ඉඩම් ආඥාපනත යටතේ ඉල්ලීම් කරන්නේ නම් නොපමාව එම ඉඩම් පළාත් පාලන ආයතනවලට පවරා දීමට එකඟවී ඇති බවද වැඩිදුරටත් දන්වමි.

පළාත් පාලන කොමසාරිස්
දකුණු පළාත.

පිටපත්:

01. ලේකම්,
පළාත් පාලන ප්‍රතිසංස්කරණ
කොමිෂන් සභාව.

ඔබේ අංක: ප.පා.ප්‍ර.කො./පරි/නි/06 හා 1998.12.19 දිනැති ලිපිය හා බැඳේ.

✓02. ඉඩම් කොමසාරිස්

දැ.පි.

03. පළාත් ඉඩම් කොමසාරිස්

දැ.පි.

04. ප්‍රා.ප.පා.ස.කොමසාරිස්
ගාල්ල/මාතර/හම්බන්තොට.

දැ.පි හා අ.ක.ස.

05. ලේකම්/නාගරික කොමසාරිස්
ප්‍රා.ස/ මා.න.ස/ න.ස

මෙම චක්‍රලේඛ උපදෙස් අනුව ක්‍රියාකර එහි ප්‍රගතිය මසක් ඇතුලත මා වෙත වාර්තා කරන්න.

1999 ක්වූ ජනවාරි මස 29 වැනි දින,
අංක: 26, කොටුව, පල්ලිය වීදියේ
පළාත් පාලන දෙපාර්තමේන්තුවේදී ය.

ය.ලේ/ස